# 1 පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම.

මිනිස් ශිෂ්ටාචාරය ආරම්භවීමත් සමග ම ප්‍රාථමික සමාජයෙහි මිනිසුන් ගී ගැයීමෙහි නැටීමෙහි යෙදුණු බව විශ්වාස කළ හැකි ය. එනම් ගීතයට දීර්ඝ ඉතිහාසයක් ඇති බව නොරහසකි. මුල් කාලීන ගීතය අර්ථ විරහිත ශබ්ද පමණක් සමග සම්බන්ධ වී පවතින්නට ඇත. පොළොවේ අඩි ගැසීම්, අත්තල තැබීම් ආදියෙන් සමන්විත නැටුමක ස්වරූපයක් ගත් රිද්මයානුකූල අංග චලන ගීතයට පදනමක් වියි. මෙසේ පැවති ගීතය ක්‍රමක්‍රමයෙන් වර්ධනය වීම සහ ගැමි ජනයාගේ ජීවනෝපාය හා සමූහ සම්ප්‍රදායන් ගොඩ නැගිණි. ඔවුන්ගේ ජීවන ක්‍රියාවලිය හා සම්බන්ධ විවිධ අවස්ථාවන් සඳහා ජන ගී නිර්මාණය විය. මුඛ පරම්පරා ගත පැවැත්මක් ජන ගීය සතු වේ. ගැමියාගේ මුවින් පිළිනුණු කාව්‍යමය වදන් වැල හඬ නගා ගයද්දී ගම ගයන දෙසතර දැක්කේ මහාව සංගීතයේ කාලාන්තරයක් මුරල්ලේ පැවත ආ පරම්පරාවෙන් පරම්පරාවට ගලා ආ දැනුම් සම්භාරය යි. ගැමි ජීවිතයේ සිතුම් පැතුම් හා ජීවන අත්දැකීම් වස්තු විෂය කොට ගත් ජන ගීය විසින් සන්නිවේදනය කරනු ලබන්නේ ගැමියා අත් විඳින යුග පරම්පරාවේ ජීවන ප්‍රවෘත්තිය යි. ජන කවියාගේ ජීවන දෘෂ්ටිය, සිතුම් පැතුම්, ජීවන ගැටළු, දුක් වේදනා, සමාජ සම්බන්ධතා සිරිත් විරිත් හා ඇදහීම් යනා කරුණු මූර්තිමත් කෙරේ. ජන කවිය එක් ජාතියකට හෝ එක් රටකට සීමා වූවක් නොව සිණ්ට අයිණ්ට සැම මනුෂ්‍ය වර්ගයාටම පොදු වූවකි. අද ලෝකයේ සෑම රටකටම ඔවුන්ගේ භාෂාවෙන් ව්‍යවහාර වන ජන කවි තිබේ.

ජනශ්‍රැති අතරින් ජන කවියට හිමි වන්නේ මුල් තැනකි. සිංහල ජාතිය ආරම්භ වීමටත් ප්‍රථම මේ රටේ ජන කවිය තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය. කාලයෙන් කාලයට ජන කවියෙහි බස් වහර වෙනස් වීමත්, ප්‍රදේශයෙන් ප්‍රදේශයට මඳ වෙනස්කම් ඇතිව පැවතීමත් ජන කවියෙහි විශේෂ ලක්ෂණ වේ. පැරණි ජන කවි වෙනස් වීම්වලට ලක් වෙමින් යුගයෙන් යුගය ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරයන්ට අනුව නැවත ගැළපුණ ද ජීවයේ පැරණි ගති ලක්ෂණ ගැබ්ව ඇත. බස් වහර වෙනස් වන නමුත් විටකම ජන කවියෙහි අන්තර්ගතය වෙනස් නොවේ.

ජන දිවියෙහි විවිධ අවස්ථාවන් හා බැඳී ගීත බොහොමයක් ඇති අතර එයින් මෙහි අධ්‍යයනය සඳහා මා යොදා ගෙන ඇත්තේ කෘෂිකර්මය හා බැඳී පවතින ගීතයි. සිංහලයාගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තයයි. ස්වකීය භූමියේ සරුසාර භූමි සංස්කෘතියක් ගොඩනැංවීමට ගොවියෝ අතලස්ව සිය කාලය, ශ්‍රමය වැයකරමින් දාඩිය මුගුරු

සෙවූහ. සෙසින් සරු අස්වැන්නක් ලබා ගැනීම සඳහා ගොවියාගේ ඇප කැප වීම මෙහෙවීන් හේතු සාධක විය. අතීතයේදී කෘෂිකාර්මික රටක් වශයෙන් ශ්‍රී ලංකාව නමක් දිනා ගත්තේ නොමසුරු කැපවීමක් එය කෙරේ ගොවියා තුළ තිබූ ගෞරවාදර භක්තියක් නිසා ය. පැරන්නන් සතුව තිබූ ගැමි තාක්ෂණය, ඇවතුම් පැවතුම්, විශ්වාස පද්ධතිය මෙන්ම භාෂා ව්‍යවහාර රටාව ද ගොවිතැන ආශ්‍රයෙන් විද්‍යමාන වේ. කමත ආශ්‍රයෙන් සුවිශේෂී වාග් කෝෂයක් ගොඩ නැගී ඇත. බුද්ධ භෝජයට ඔවුන් තුළ පැවති ගෞරවය, භක්තිය එවැනි වදන් වැලක් බිහිවීමට හේතු විය. එසේත් මිනිසාගේ චින්තන පද්ධතිය වෙනස් වීමෙන් එකී භාෂාව අභාවයට යමින් පවතී. එසේ භූමි භාගයක් තුළ වුවත් භූගෝලීය හේතු සාධක මත භාෂාවේ ප්‍රාදේශීය විවිධත්ව දක්නට ලැබේ. මෙම විවිධත්වය ඒ ඒ ප්‍රදේශවල සිංහල ජන ගීයට බලපෑම් කර ඇත්දැයි සෙවීම මෙහිදී සිදු කර ඇත. ජන ගී වර්ග බොහොමයක් ඇති අතර මෙහි අධ්‍යයනය සඳහා කෘෂිකාර්මික ජන ගී පමණක් යොදා ගෙන තිබේ. ලාංකිකයෝ අනාදිමත් කාලයක සිටම ගොවිතැන සිය ප්‍රධාන ජීවනෝපාය වශයෙන් තෝරා ගත් අතර එහිදී ගොවිතැනේ විවිධ අවස්ථාවන්ට මුහුණ දීමට සිදුක්ව සිදු විය. ප්‍රධාන වශයෙන් ගොවිතැන මඩ ගොවිතැන හා ගොඩ ගොවිතැන වශයෙන් දෙයාකාර වේ. මඩ ගොවිතැනේ විවිධ අවස්ථාවන් හා සම්බන්ධව කවි කියනු ලැබේ. වරම් පැනීමේ කවි, අලඟ සිවිපද, ගොයම් නෙළීමේ කවි, පැල් කවි, ගොයම් කැපීමේ කවි, අඬහැර පෑම, කළවිට පිරිත, කමත් කවි ඒ අතර වේ. මඩ ගොවිතැන අපේ ජන කවියාට කවි ගෙතීමට, ගැයීමට හා සංස්කෘතික අංගයන් පවත්වාගෙන යාමට තෝතැන්නකි. පාරම්පරික ලෙස හා සම්ප්‍රදායික ලෙස වී ගොවිතැන්කරන බැවින් එම ගොවිතැනට උපයෝගී කර ගන්නා සතුන්ට හා වෙනත් උපකරණවලට පාරම්පරිකව භාවිතාකරන වචන රාශියක් ඇත. මෙම වචන ඒ අවස්ථාවල ගයන ගීයට ද යොදා ගෙන ඇත්ද යන්න සොයා බැලීම වටී. එමෙන් ම ගොඩ ගොවිතැන හා සම්බන්ධ ජනශ්‍රැති රාශියක් ද අපේ සංස්කෘතියට එක්වී තිබේ. සාමාන්‍ය උස්බිම්වල කරන වගාවන් මෙන් ම හේන් ගොවිතැන මේ යටතට අයත්වේ. පැරණි පොත පත ඇසුරින් හෙළි වන හේන් ගොවිතැන් පිළිබඳ වූ තොරතුරු අල්ප වුවද එහි භාෂාත්මක ලක්ෂණ විමසීමේදී එහි අල්ප බවක් දක්නට නොලැබේ. හේන් ගොවිතැනේදී ප්‍රධාන වශයෙන් වගා කෙරෙන්නේ වී නොව සවුසර හෝග වගාවන්ය. ප්‍රධාන වශයෙන් කුරක්කන්, ඉරිඟු තල ආදියයි. මෙලෙස හේන් ගොවිතැන හා සම්බන්ධ වී ඇති ජන කවි මාලාවක් බිහි වී ඇති අතර ඒ ඒ ප්‍රදේශ අනුව ඒවා විවිධත්වයක් ඇත්ද යන්න මෙහි විමසා බලා ඇත.

මුඛ පරම්පරාවෙන් කවිය ව්‍යාප්තවීම නිසා කලක් යාමේදී කවියේ මුලින් තිබූ වචන වෙනුවට නව වචන එක් වීමෙන් ද්විතීය උපතක් ලබයි. මේ වෙනස් වීම හිතාමතා කරන ලද්දක් නොවේ. එය අවිඥානකව සිදුවූවකි. අද පොදු ජන ව්‍යවහාර භාෂාව අනුරාධපුර

යුගයේ ව්‍යවහාර වූ භාෂාව නොවේ. ව්‍යවහාර භාෂාව හෝ ග්‍රන්ථ භාෂාව ද වෙනස් වූ අන්දම ඒ ඒ යුග වලට අයත් පත පොත කියවීමේදී පැහැදිලි වේ. කාලය අනුව පොදු ජන ව්‍යවහාර භාෂාව වෙනස් වෙන්ම ජන කවියේ වචන ද වෙනස් වූවේය. අනුරාධපුර යුගයේ බිහිවූ ජන කවියක් අදත් තිබෙන්නට පුළුවන. නමුත් ඒ කවියේ ඇත්තේ අනුරාධපුර යුගයේ භාවිතා වූ වචන නොවේ. කාලය අනුව ද ජන කවියේ වචන වෙනස් වේ. එය අපේ රටට පමණක් පොදු වූවක් නොවේ. ජනකවි ව්‍යවහාර වන සෑම රටක ම පොදු වූ ධර්මතාවයකි. එසේම එකම වකවානුවේ වුවද ප්‍රදේශ අනුව සමහර වචන වල භාවිතය වෙනස් වේ. දකුණෙන්, සබරගමුවෙන්, මධ්‍යම පළාතෙන්, උතුරුමැද පළාතෙන් ආදී වශයෙන් ගත් කල ව්‍යවහාර භාෂාව වෙනස් වන බව පෙනේ. ඒ අනුව ඒ ඒ ප්‍රදේශවල භාවිතා වන එකම ජන කවියේ වුවද සුළු සුළු වෙනස් කම් ඇති බව පෙනේ. කවියේ වචන වෙනස් වීම පොදු ජනයාගෙන් පමණක් නොව එකම පුද්ගලයාගෙන් වුව ද වෙනස් වන බව පැහැදිලි වේ. එයට හේතුව කවියේ අදහස මතක වුවද වචන අමතක වීම නිසා තමුන් මේ වචනයයි සිතා අදහසට සමාන වෙනත් වචන යෙදීමයි. තව ද එකම ජන කවිය විවිධ ප්‍රදේශවල විවිධාකාරයෙන් ගයන බව පෙනේ. එනම් ජන ගීයේ ගයන ස්වර පරාසය, ශ්‍රැතිය, රිද්මය ආදියෙන් වෙනස් වන බව පෙනේ. මෙසේ වී ඇත්තේ පුහුණු ක්‍රම නොමැති වීම නිසාය. මේ පිළිබඳව විමසා බැලීම මෙහිදී සිදු කර ඇත.

මවිසින් මෙවැනි ක්ෂේත්‍රයක් අධ්‍යයනය කිරීමේ හේතු ගණනාවක් තිබේ. එනම් අධ්‍යාපනික වශයෙන් වැදගත් ගැටලුවක් වීම, පර්යේෂණ ඇස ප්‍රමාණවත් තරම් යොමු නොවීම නිසා එම ක්ෂේත්‍රය තුල හිදැසක් දිස්වීම මෙන්ම ජනශ්‍රැති අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුමට තවදුරටත් එකතු කිරීමක් අවශ්‍ය වීම යන කරුණු දැක්විය හැකිය.

විද්‍යාත්මක අධ්‍යයනයක් කිරීමට යම් සමාජයක් සතු ජනශ්‍රැති පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කර අධ්‍යයනය කළ යුතු වේ. මෙය එක් පුද්ගලයකුගේ වුවමනාවක් නිසා පහළ වූවක් නොව සමාජීය අවශ්‍යතාවයක් නිසා බිහි වූවකි. එක් පුද්ගලයකුගේ වුවමනාවක් පිණිස බිහි නොවීම ජනශ්‍රැතියේ විශේෂ ලක්ෂණයකි. එම නිසා ජනශ්‍රැතිය අතීතයට හා වර්තමානයට පමණක් අදාල ක්‍රියාදාමයක් නොව සමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ප්‍රශ්න සම්බන්ධයෙන් අනාගතය පිළිබඳවද අවබෝධයක් ලැබිය හැකි විෂයකි. මේ විෂය ක්ෂේත්‍රයේ වැදගත් අවබෝධයක් ලබා ගත් දියුණු රටවල උගත්තු මේ පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වා විද්‍යාත්මකව ජනශ්‍රැති එකතු කර පර්යේෂණ පවත්වා ග්‍රන්ථාරූඪ කරති. ජනශ්‍රැති ජනතාවගේ සංස්කෘතික පසුබිමට කෙළින් ම සම්බන්ධ වන සමාජ නිර්මාණයක් බැවින් සාහිත්‍ය, ඉතිහාසය, පුරා විද්‍යාව, සමාජ විද්‍යාව, මානව විද්‍යාව වැනි අධ්‍යයන විෂය ක්ෂේත්‍රයේ දී ජනශ්‍රැති අවශ්‍ය වන අවස්ථා

මෙනෝ ය. සමාජ විද්‍යා ක්ෂේත්‍රයට අයත් මෙබඳු විෂයන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට මූලාශ්‍ර වන්නේ ජන කවි හැකහොත් ජනශ්‍රැතියි.

සාමාන්‍ය ජනයාගේ සිතුම් පැතුම් අඩංගු වන ජනශ්‍රැති රැස ගැනීමට සැම රටක ම පාහේ උත්සාහයක් දරනු ලැබේ. සංස්කෘතික උරුමයන් ලෙස ඒවා රැස ගැනීමට වර්තමානයේ නවීන ක්‍රම ඇතිමේ. එබඳු පටිගත කිරීමේ යන්ත්‍ර මගින් කියන, ගයන හඬින් ම වචනේ කර ගත හැක. ජී.බී. මලලසේකර හා ඩබ්ලිව්.ඒ. සිල්වා මහතාගේ ජනකවි සංග්‍රහය අපේ ජන කවි රැස ගැනීමට ගත් පළමු උත්සාහයක් ලෙස සැලකිය හැකිය. එහෙත් එම ග්‍රන්ථය දැන් දුර්ලභ පොත් ගණයට වැටෙන්නෙකි. ආචාර්ය නන්දදේව විජේසේකර මහතාගේ සහ ඩී.ඩී. ද ලැනරෝල් මහතාගේ ජන කවි එකතු කිහිපයක්, ප්‍රවෘත්ති පොර්තමේන්තුවේ පළවී ඇති එච්.ශ්‍රී ප්‍රඥාලෝක හිමියන් සම්පාදිත පුරාණ සිව්පද සංග්‍රහයත්, සාමාන්‍ය පාඨකයාට ලබා ගත හැකි ජන කවි සංග්‍රහයෝ ය. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් අවුරුදු ගණනාවකට ඉහත පළවූ ශ්‍රී ලංකා සගරාව ද ජන කවි, ජනකථා හා ජන ගී රැස ගැනීමට උත්සාහයක් දැරූ රජයෙන් පළකළ මාසික සගරාවකි. සංස්කෘතික අමාත්‍යාංශය මගින් ජන කවි එක් රැස් කර රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇත. වර්තමාන සංගීත, නර්තන ආදී කලා කටයුතු සඳහා ජන ගී සංගීතය මුසු කර ගැනීම මගින් ජන ගී වර්තමාන භාවිතයට පත්කළ හැකිය. සරල ගීත ආදියට ජන ගී ආශ්‍රය කර ගැනීම තුළින් ඒවායේ වටිනාකම වැඩි දියුණු වේ.

මෙතෙක් සටහන් කර ගෙන ඇති ජන කවිවලට වඩා විශාල සංඛ්‍යාවක් සටහන් කර ගැනීමට ඉතුරු වී තිබෙන්නට හැකි ය. පැරණි ජන ගී ගායනා කළ හැකි පැරන්නන් සැම ගමක ම පාහේ සිටින බැවින් මහලු වියේ සිටින ඔවුන්ගේ අභාවයත් සමගම ඒ උරුමය ද නැතිවී යන බැවින් ඒවා එක් රැස් කර ආරක්ෂා කර මතු පරපුරට ඒවා දායාද කිරීම වටිනා දෙයක් වන්නේ ය. විශේෂයෙන් ම වර්තමානය වන විට කෘෂිකාර්මික කටයුතුවලදී ජන ගී භාවිතය නොවන තරම් ය. කෘෂිකර්මය හා බැඳී පවතින ගීත රාශියක් අපට දායාද වී ඇති අතර එහි ප්‍රාදේශීය විවිධත්වය විමසා බැලීම මෙම කෘතියෙන් සිදුකෙරේ.